ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ ඉන්දියා - ශ්‍රී ලංකා ඒකාබද්ධ කාර්ය කණ්ඩායමේ පළමු හමුව කොළඹ දී පැවැත්වේ

ශ්‍රී ලංකා ජනාධිපතිතුමා විසින් 2023 ජූලි මාසයේ සිදු කරන ලද ඉන්දීය සංචාරය අතරතුර අත්සන් තබන ලද පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය තුළ සහයෝගීතාවය සඳහා වන අවබෝධතා ගිවිසුම යටතේ පිහිටුවන ලද පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ ඒකාබද්ධ කාර්ය කණ්ඩායමේ පළමු හමුව 2024 මාර්තු 11 වන දින කොළඹ දී පැවැත්විණ.

2. ඉන්දියානු පාර්ශ්වය නව සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් ශ්‍රී භූපින්දර් සිං හල්ලා මහතාගේ ප්‍රධානත්වයෙන් ද ශ්‍රී ලංකා පාර්ශ්වය විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය සුලක්ෂණ ජයවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් ද මේ සඳහා සහභාගී විය. නව සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ, ඉන්දීය මධ්‍යම විදුලිබල අධිකාරියේ සහ කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන් ඉන්දීය නියෝජිත පිරිසට ඇතුළත් විය. ඉන්දියාවේ ප්‍රධානතම බලශක්ති සමාගම් නියෝජනය කරමින් ඉන්දියානු කර්මාන්ත මණ්ඩලයේ (CII) දහ හත් සාමාජික නියෝජිත පිරිසක් ද නිල නියෝජිත පිරිස සමඟ එක් විය. ශ්‍රී ලංකා නියෝජිත පිරිස විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේ, ලංකා විදුලිබල මණ්ඩලයේ සහ විදේශ අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් සමන්විත විය.

3. මෙම හමුව අතරතුර දී ඉන්දීය නියෝජිත පිරිස පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය තුළ ඉන්දියාවේ ජයග්‍රහණ, පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය තුළ ආයෝජන දිරිගැන්වීම සඳහා ඉන්දීය රජය විසින් පිරිනමන පුරවැසි කේන්ද්‍රීය යෝජනාක්‍රම, ජාතික හරිත හයිඩ්‍රජන් මෙහෙයුම සහ ඉන්දියාවේ දේශසීමා හරහා සිදුවන විදුලිබල වෙළඳාම යනාදිය පිළිබඳ

සවිස්තරාත්මක ඉදිරිපත් කිරීමක් සිදු කළේය. ශ්‍රී ලංකා පාර්ශ්වය ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයේ වර්තමාන තත්වය සහ පුනර්ජනනීය බලශක්තිය බලශක්ති මුසුවට දක්වන දායකත්වය ඉස්මතු කර දැක්වීය. ශ්‍රී ලංකාව වසර 2030 වන විට බලශක්තියෙන් 70%ක් පුනර්ජනනීය බලශක්තිය මඟින් ජනනය කරගැනීමේ ඉහළ ඉලක්කයක් සඳහා කටයුතු කරන බැවින් ඉන්දියානු සමාගම්වලට ආයෝජන සඳහා සුවිසල් අවස්ථාවක් පවතින බව ලේකම්තුමා මෙහිදී සඳහන් කළේය. යෝජනා ඇගයීම සහ ශ්‍රී ලංකා නිලධාරීන් පුහුණු කිරීම සඳහා ධාරිතා ගොඩනැඟීමේ සහය ලබා දෙන ලෙස එතුමා ඉන්දීය රජයෙන් ඉල්ලා සිටියේය.

4. ඉන්දීය පාර්ශ්වය සූර්ය බලය, සුළං, ජෛව ඉන්ධන සහ විදුලිබල ජාල සම්බන්ධතා යන අංශ සම්බන්ධයෙන් සූර්ය බලශක්තිය පිළිබඳ ජාතික ආයතනය, සුළං බලශක්තිය පිළිබඳ ජාතික ආයතනය සහ ජෛව බලශක්තිය පිළිබඳ ජාතික ආයතනය වැනි ඉන්දියාවේ ප්‍රමුඛතම ආයතනවල පුහුණුවීම් ලබා දෙමින් ශ්‍රී ලංකා රජයට හැකි සියලුම තාක්ෂණික සහයෝගය ලබා දීමට එකඟ විය.

5. ලේකම්තුමා ප්‍රමුඛ ඉන්දීය නියෝජිත පිරිස 2024 මාර්තු 12 වන දින ශ්‍රී ලංකාවේ විදුලිබල සහ බලශක්ති අමාත්‍ය කංචන විජේසේකර මහතා හමු වී පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ සමස්ත පරාසය සහ එය තවදුරටත් පුළුල් කළ හැකි ආකාර පිළිබඳව සාකච්ඡා කළහ.

6. ඒකබද්ධ කාර්ය කණ්ඩායම් හමුවට සමගාමීව 2024 මාර්තු 11 වන දින ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ලංකා වාණිජ මණ්ඩලය සහ CII සමඟ එක්ව 'ඉන්දියා - ශ්‍රී ලංකා සබඳතා පුනර්ජනනීය බලශක්ති සහයෝගීතාවය හරහා බලගැන්වීම' යන මැයෙන් ව්‍යාපාරික වැඩසටහනක් සංවිධානය කර තිබිණ. මෙම වැඩසටහන සඳහා ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් රැසක් සහභාගී වූහ. පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ ඉන්දියා - ශ්‍රී ලංකා සහයෝගිතා අංශයන් පිළිබඳව සාකච්ඡාවක් ද මෙහිදී පැවති අතර ශ්‍රී ලංකාවේ විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා, ඉන්දියාවේ නව සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්තුමා, ඉන්දීය මහ කොමසාරිස්තුමා සහ ශ්‍රී ලංකාවේ

විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්තුමා මෙහිදී අදහස් දැක්වූහ. ශ්‍රී ලංකාවේ ආයෝජනය කරන ලෙස සහ අනාගතයේදී ඉන්දියාවට පුනර්ජනනීය විදුලිය අපනයනයට පවතින විශාල විභවතාවයෙන් ප්‍රයෝජන ලබා ගන්නා ලෙස අමාත්‍යතුමා ඉන්දීය සමාගම්වලට ආරාධනා කළේය.

7. ඉන්දියාවේ බලශක්ති ක්ෂේත්‍රයේ සාමාජිකයන් ඇතුළු ඉන්දියාවේ නව සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රමුඛ නියෝජිත පිරිසේ ශ්‍රී ලංකා සංචාරය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ සමීප සහයෝගීතාවයට තවදුරටත් ජවය ලබා දෙනු ඇත.

***

***කොළඹ***
***2024 මාර්තු 13***